**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**
**කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
**මහවැලි තරුණ ව්‍යවසායකත්ව නිම්න ව්‍යාපෘතිය - 2026**

## ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් සඳහා තරුණ ව්‍යවසායකයින් බඳවා ගැනීම.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු මොරගහකන්ද කලාපයේ ගුරුවෙල ගොවිපළ කේන්ද්‍ර කරගනිමින්, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන 'ස්මාර්ට්' (SMART) වාණිජ කෘෂිකාර්මික ආකෘතියක් ස්ථාපිත කිරීම සහ එමගින් මහවැලි කලාපීය තරුණ ප්‍රජාව සවිබලගන්වන ලද ව්‍යවසායකත්ව සවිබල ගැන්වීමේ මධ්‍යස්ථානය නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි.මාස 2 ½ ක පුහුණුවක් සමග වසර 02ක කුලී පදනම යටතේ ආරක්ෂිත ගෘහයන් තුල වගා කිරීමට අවස්ථාව සලසා දීම හා ව්‍යවසායකත්ව කටයුතු සඳහා බැංකු ණය පහසුකම් සලසා දීමද මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ.

**අධ්‍යාපන සුදුසුකම්**

I. කෘෂිකර්මාන්තය පිළිබඳ උපාධියක් හෝ කෘෂිකර්මාන්තය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

**වයස**

I. අයදුම් කරුවන්ගේ වයස අවු. 25 – අවු.35 ත් අතර විය යුතුය.

**පොදු කොන්දේසි**

I. අවශ්‍යතාව අනුව ක්ෂේත්‍ර කටයුතු වල නිරත වීමට හැකියාව පැවතිය යුතුය.
II. ඉංග්‍රීසි භාෂාව, පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ප්‍රවීණත්වය සහ රාජ්‍ය රීති සහ රෙගුලාසි පිළිබඳ පුරුද්ද අවශ්‍ය වේ.
III. අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් තිබීම අමතර වාසියකි.
IV. සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තීරණය අවසාන හා තීරණාත්මක වේ.
V. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
VI. නේවාසිකව කටයුතු කිරීමේ හැකියාවද පැවතිය යුතුය.
VII. ව්‍යාපෘතිය හා ගිවිසුම්ගත වීමට හා ගිවිසුම් ගත රාමුව ඇතුලත කටයුතු කිරීමට හැකි විය යුතුය.
VIII. ණය සාක්ෂරතාවය හා බැංකු ණය සඳහා ඉල්ලුම් කිරීමට මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.

***අයදුම්පත්***

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත්, ආවරණ ලිපියක්, ජීවදත්ත තොරතුරු සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු හා සියලුම සහතික වල පිටපත් සමඟ, 2026 සැප්තැම්බර් 20 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතු අතර, අවසාන දිනට පෙර තම අයදුම්පත් mahawaliyagro@gmail.com විද්‍යුත් ලිපිනය වෙත එවිය යුතුය. තවද අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයට පෙර තොරතුරු සඳහා පමණක් https://forms.gle/4sGYSYqArUhyXDPHA සබැඳිය ඔස්සේ ගූගල් පත්‍රිකාව පිරවිය යුතුය. ගූගල් පත්‍රිකාව නිල අයදුම්පත ලෙස සලකනු නොලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,**
**අංක: 500,**
**ටී.බී. ජායා මාවත,**
**කොළඹ 10.**